www.xtrapapers.com



Diploma Programme
Programme du diplôme
Programa del Diploma

# Sinhalese A: literature – Standard level – Paper 1
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 1
# Singalés A: literatura – Nivel medio – Prueba 1

Wednesday 10 May 2017 (afternoon)
Mercredi 10 mai 2017 (après-midi)
Miércoles 10 de mayo de 2017 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

## Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Write a guided literary analysis on one passage only. In your answer you must address both of the guiding questions provided.
- The maximum mark for this examination paper is **[20 marks]**.

## Instructions destinées aux candidats

- N’ouvrez pas cette épreuve avant d’y être autorisé(e).
- Rédigez une analyse littéraire dirigée d’un seul des passages. Les deux questions d’orientation fournies doivent être traitées dans votre réponse.
- Le nombre maximum de points pour cette épreuve d’examen est de **[20 points]**.

## Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un análisis literario guiado sobre un solo pasaje. Debe abordar las dos preguntas de orientación en su respuesta.
- La puntuación máxima para esta prueba de examen es **[20 puntos]**.



2217–0179
© International Baccalaureate Organization 2017

www.xtrapapers.com



මෙම ඡේද අතුරෙන් **එකක්** සඳහා සාහිත්‍යමය විවරණයක් සපයන්න. පහත දක්වා ඇති උපකාරක ප්‍රශ්න දෙකට පිළිතුරු ඇතුළත් වන සේ විවරණය ඉදිරිපත් කළ යුතුයි.

**1.**

බක්කි කරත්තය ගම්සභා පාරෙන් දකුණට හැරී අතුමඟට වැටුණු බව අඩ නිදිමතින් පසු වූ එරෝලිස් අප්පු වෙදරාල දැනගත්තේ මේ දක්වා එක දිගට ඇසුණු වැලි බොරළු කපා ගෙන යන රෝද හඬ එකවරම නොඇසී ගිය බැවිනි. අඳුරු පැහැති වියැළි තද මඩ පසින් හා තණ ඇතිරියෙන් යුතු අතුමඟෙහි ගමන් කරන විට, තෙතබරිත ගෝනි පලසක් මත ගමන් කරන්නාක් මෙන් කරත්ත රෝදවලින් එවැනි ගොරහැඬි හඬක් නොනැඟෙයි. නිදිමත පලවා හැර අවට බලන වෙදරාලට තම දෑස් ඉදිරියෙහි දිස්වන්නේ ඈතට පැතිර ගිය දවස දෙවේලේ දක පුරුදු විසල් වෙල්යායයි. පාරෙහි එක් පසෙකින් මේ මහවෙල්යාය වූ අතර, අනික් පසින් අතරින් පතර උස් ගස් සහිත ලඳු කැලෑවෙන් ගැවසීගත් ගොඩබිම් පෙදෙස පිහිටා තිබිණි. කොස්, දෙල්, පොල්, පුවක් අඹ, දඹ, වෙරළු ආදී උස් ගසින් සෙවණ වූ මේ ලඳුකැලෑ සහිත බිමෙහි එකිනෙකට ඈතින් ඉදි කළ පළ දෙකේ පොල් අතු සෙවෙණි කළ වරිච්චි ගෙවල් කීපයක් හා ඒ අතර උළු සෙවෙණි කළ ගෙයක් දෙකක් දක්නට ඇත.

වෙදරාල කරත්තයෙහි හිඳගෙන සිටියේ වෙල්යාය දෙසට මුහුණ ලා බැවින් කිරට නැමුණු පළාවන් පැහැයෙන් යුතු ගොයමින් වැසුණු මහා වෙල්යායත්, ඊට ඉහළින් පෙනෙන නිල්වන් අහස් තලයත් ඔහුට පෙනෙන්නේ කරත්තය පසු කොට ඇදී යන කොළ හා නිල් පැහැයෙන් යුතු විසල් තිරකඩක් මෙනි. කරත්තය එන හඬ අසා පටුමඟ අසල ලියදිවල සිට අහසට නැඟෙන කොක්රැන් එම තිරකඩෙහි විසුරුවා හල සුදු තීන්ත පැල්ලම් වැන්න.

හැල්මේ ගිය කරත්තය එකවරම ගොඩබිම දෙසට හැරී කුඩා කඳුගැටයක් නැඟ, සුදුවැලි අතුළ පුළුල් ගෙමිදුලක කෙළවර තිබූ විසල් දෙල් ගසක් යට නතර කරනු ලැබිණි. කරත්තය දක්කා ගෙන ආ මහලු පුංචප්පු, එය නතරකිරීමට ඇදගත් ගොනාගේ තෝන් ලණුව දිගටම ඇදගෙන සිටින්නේ වෙදරාල කරත්තයෙන් බසින විට ගොනාට එය සෙලවීමට නොහැකි වනු පිණිසය. තෝන් ලණුව ඇදීමෙන් තදවන නාස් ලණුව නිසා අං දෙක කරත්තයේ වියකඳෙහි සිරවන තරමට උඩට උස් වූ සුදු ගොනාගේ මුහුණෙහි විවර වූ දෙනෙත් තුළ ඇත්තේ වියරු ස්වභාවයකි. වෙහෙසට පත් උගේ මුවින් පෙණ කැටි විසිරෙයි.

"සුද්දා ලිහා දාපන් පුංචප්පු. ඌට මහන්සි ඇති" යි කරත්තයෙන් බිමට බසින අතර වෙදරාල කීවේය. "දැන්ම වෙන ගමනක් යන්නවෙන එකක් නැහැ."

ගමනක් යන විට නිතර සිරිතක් ලෙස අතේ ගෙන යන නැමුණු ලී මිට සහිත කුඩය ද රැගෙන කරත්තයෙන් බැසගත් ඔහු මිදුල හරහා ආලින්දය දෙසට ගමන් කරන්නට විය. මඳක් මිටි තරබාරු පෙනුමෙන් යුතු වෙදරාල මැදුම් වියෙහි පසුවන්නකු වුවද, තරුණයකු මෙන් ඍජු ගමන් විලාස ඇත්තෙකි. හිස මුදුනින් තුනී වූ ඝන කොණ්ඩය තෙල් ගා පීරා පිටිපසට කර බැඳ ඇති අයුරිනුත්, දෙකොනින් කොට වන සේ කැපූ උඩු රැවුළ නිසාත් ඔහුගේ රවුම් මුහුණට තේජස් බවක් සමඟ ප්‍රියමනාප කාරුණික හැඩයක් ද එක්වෙයි.

සමරවීර විජයසිංහ, *ස්වයංජාත* (2007)

(අ) මෙම ඡේදයේ ප්‍රධාන තේමාවට අදාළව කතුවරයා අවස්ථාව හා විස්තර කථනය යොදා ගෙන ඇති ආකාරය පිළිබඳව අදහස් දක්වන්න.

(ආ) මෙම ඡේදයේ දී කතුවරයා යොදා ගෙන ඇති භාෂාව හා රචනා ශෛලිය පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක්ද?

www.xtrapapers.com



**2.**

### දෙදෙනාම දියණියෝ

තැනින් තැන ඉරී ගිය, කිලිටි වී ගිය ගවොම
දවස් ගණනාවකින් තෙල් පොදක් නොදුටු හිස
එක අතෙක ඉරී ගිය පරණ පත්තර පිටුව
ඈ සිටී අවන්හල දොරකඩෙහි හැමදාම

උයා ඇති මුත් රසට මගෙ දිවා භෝජනය
එපා වී ගියේ කිම
හදවතේ ඇඳුණා ද ඇගේ අසරණ දෙනෙත
කිසි දිනෙක ඇසෙන්නට ගායනා නොකළ ඇගෙ
සිහින් සෝබර ගීය ඇසුණා ද, දෙසවනට

සති අන්තයෙ දිනෙක කුඩා දියණියන් හට
අනෙක මසවුළු සමඟ බත් කටක් කවන්නට
කොතෙක් දරමි ද වෙහෙස
කුඩා දෑතෙහි රැඳෙන ඇගෙ දිවා භෝජනය
ගේ පුරා විසිර යයි

අවන්හල දොරකඩෙහි නෙත් අයා සිටින්නී
බත් උළක් වැටෙන තෙක් ඉරුණ කඩදාසියට
කෙසේ නම් වෙනස් වෙද මගේ දියණිය ඇයට
දෙදෙනාම එකම එක අහස යට උපන් කල

බුද්ධදාස ගලප්පත්ති, *දෙදෙනාම දියණියෝ* (1983)

(අ) කවි පන්තියේ ප්‍රධාන තේමාව ගෙන හැර දැක්වීමට කතුවරයා ගෙන ඇති ප්‍රයත්නය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

(ආ) මෙම කවි පන්තියේ උපයුක්ත භාෂාව හා කාව්‍යෝක්ති පාඨකයාට ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳ විවරණයක් සපයන්න.